# කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
# දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

## 2025 අධ්‍යයන වර්ෂය සඳහා
## බාහිර උපාධි පාඨමාලා සඳහා අයදුම්පත් කැඳවීම

කැලණිය විශ්වවිද්‍යාලයේ දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය, පහත සඳහන් බාහිර උපාධි පාඨමාලාවන්ට නවක විද්‍යාර්ථීන් බඳවා ගැනීම සඳහා **www.cdce.kln.ac.lk** යන වෙබ් අඩවිය මගින් **2025.11.20** සිට **2025.12.31** දක්වා මාර්ගගත ක්‍රමය (online) ඔස්සේ අයදුම්පත් කැඳවනු ලැබේ.

| **අංකය** | **පාඨමාලාව** | **පාඨමාලා ගාස්තුව** | | **පාඨමාලා කාලය** | **පාඨමාලා මාධ්‍යය** |
|---|---|---|---|---|---|
| 01. | ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධිය | රු. 100,000.00 | **මෙය වාරික 05කින් ගෙවීම් කළ හැකිය** | වසර තුනකි | සිංහල |
| 02. | ව්‍යාපාර කළමනාකරණවේදී සාමාන්‍ය (බාහිර) උපාධිය | රු. 200,000.00 | | වසර තුනකි | සිංහල / ඉංග්‍රීසි |
| 03. | වාණිජ විද්‍යාවේදී ගෞරව (බාහිර) උපාධිය | රු. 250,000.00 | | වසර හතරකි | සිංහල / ඉංග්‍රීසි |
| 04. | විද්‍යාවේදී සාමාන්‍ය (බාහිර) උපාධිය | රු. 300,000.00 | **මෙය වාරික 06කින් ගෙවීම් කළ හැකිය** | වසර තුනකි | ඉංග්‍රීසි |

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

1. 2024 හෝ ඊට පෙර වර්ෂවල ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පරීක්ෂණයෙන් තෙවතාවක් තුළ, එක් වරකදී ම සමත් වී තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම.

2. ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ රාමුවේ දැක්වෙන යෝග්‍යතා මට්ටම් දෙක (SLQF Level - 2) සම්පූර්ණ කිරීම හෝ ජාතික වෘත්තීය පුහුණු සුදුසුකම් මට්ටම් පහ (NVQ Level –5) සම්පූර්ණ කිරීම හෝ ජාතික වෘත්තීය පුහුණු සුදුසුකම් මට්ටම් හතර (NVQ Level – 4) සමඟ අවම අධ්‍යයන සම්භාර 15ක් සම්පූර්ණ කිරීම හෝ අවම අධ්‍යයන සම්භාර 30කින් යුත් එක් වසරක උසස් සහතික පත්‍රයක් (Advanced Certificate) හෝ ඩිප්ලෝමාවක් ලබා තිබීම.
3. කැලණිය විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් අනුමත කර ඇති වෙනත් සුදුසුකම් සපුරා තිබීම.

**සටහන**

- විද්‍යාවේදී සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව **(අංක 04)** සඳහා අයදුම් කිරීමේ දී අ.පො.ස (උසස් පෙළ) විද්‍යා විෂය ධාරාව හදාරා සංයුක්ත ගණිත විෂය සමත් වීම අනිවාර්ය වේ.

මේ සම්බන්ධව වැඩි විස්තර දැන ගැනීම සඳහා:-

වෙබ් අඩවියට පිවිසෙන්න -www.cdce.kln.ac.lk

දු. අ. - 011-2987000, 011-2987001, 011-2987002, 011-2987005
විද්‍යුත් ලිපිනය - cdce@kln.ac.lk

ලේඛකාධිකාරී
කැලණිය විශ්වවිද්‍යාලය
2025.11.16